**වවුනියාව නගර සභාව - (01/012023 – 18/03/2023)**

**-----------------------------------------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වවුනියාව නගර සභාවේ 2023 මාර්තු 18 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 මාර්තු 18 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 මාර්තු 18 දිනට වවුනියාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක්

නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට හඳුනාගෙන තිබුණු හිඟහිටි ආදායම් එකතුව රු. 3,032,661 ක් 2023 මාර්තු 18 දිනට ආදායම හා ජංගම වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2023 දෙසැම්බර් 31 න් අවසන් කාල පරිච්ඡේදයට අදාල මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අවධානය යොමුකර ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලබන බව. | අදාල කාලපරිච්ඡේදයට අයත් ආදායම් පමණක් ගිණුම්ගත කළයුතුය. |
| (ආ) | 2023 මාර්තු 18 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා රු. 4,501,412 ක් වූ ව්‍යාපෘති 11 ක වැඩ ඉටුකර නොතිබුණු නමුත් තක්සේරු ගිවිසුම් සහ තීරණ මත පදනම්ව ගෙවීම් වවුචර් සකස්කර විවිධ ණයහිමි යටතේ ගිණුම්ගත කිරීමෙන් ජංගම බැරකම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | 2023 දෙසැම්බර් 31 න් අවසන් කාල පරිච්ඡේදයේ රු.22,971,184 ක් වටිනා කාර්යයන් ඉටුකර, ගෙවීම් කර තිබුණි. ඉටුනොකළ කාර්යයන්හි වටිනාකම ලෙස රු.4,507,146 ක් දක්වා ඇති බව. | අදාල කාර්යයන් නියමිත කාලවකවානු තුළ ඉටුකළ යුතු අතර ණය හිමියන් යටතේ නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ඇ) | නවීන වෙළෙඳපොල සංකීර්ණයේ 2023 මාර්තු 18 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා බිල් කළ කුලී ආදායම රු. 1,080,924 ක්ව පැවැති නමුත් අදාල කාලපරිච්ඡේදයේ හිඟ හිටි කුලිය සමඟ රැස්කළ කුලිය රු.1,978,176 ක් සමාලෝචිත කාලපරිච්ඡේදයේ ආදායම් ලෙස දැක්වීමෙන් අතිරික්තය රු. 897,252 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම හිඟහිටිවලට අදාල ගැලපීම් 2023 දෙසැම්බර් 31 න් කාල පරිච්ඡේදයට අදාල මූල්‍ය ප්‍රකාශනවල සිදුකර වර්ෂවසාන හිඟහිටි, සමුච්චිත අරමුදල සහ ආදායම් වියදම් ගිණුමෙහි නිවැරදි ශේෂය දක්වනු ලබන බව. | තථ්‍ය ආදායම පමණක් හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | බදු පදනම මත ලබා දුන් ඉඩම සම්බන්ධයෙන් 2023 මාර්තු 18 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ බදුකුලී ආදායම් රු. 805,065 ක්ව පැවැති නමුත්, අදාල කාලපරිච්ඡේදයේ රැස්කළ හිඟහිටි ලැබීම් ද සමඟ මුළු කුලී ආදායම රු.851,649 ක් බදු ආදායම් ලෙස දැක්වීමෙන් ආදායම් අතිරික්තය රු. | 2023 මාර්තු 18 කාල පරිච්ඡේදයට අදාල හිඟමුදල ඉතා අඩු කාලයක් තුළ කාල විශ්ලේශණයක් සිදුකර ලබාගැනීමට ප්‍රමාණවත් කාලවේලා නොමැති වීමෙන් මෙම හිඟහිටි සම්බන්ධයෙන් නිවැරදි කිරීම් 2023 දෙසැම්බර් 31 න් කාලපරිච්ඡේදයට අදාල මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලබන බව. | තථ්‍ය ආදායම පමණක් හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 46,584 කින් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ඉ) | 2021 වර්ෂයේ මිලදීගෙන තිබුණු යන්ත්‍රෝපකරණ කට්ටල 05ක වටිනාකම එකතුව රු.1,765,000 ක් යන්ත්‍රෝපකරණ පිරිවැයට ඇතුළත් නොකිරීමෙන් එම වටිනාකමින් යන්ත්‍රෝපකරණවල අගය අඩුවෙන් දක්වා තිබුණි. | පරිගනක යතුරුලියන දෝෂයක් හේතුවෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සහ මූල්‍ය ප්‍රකාශනවල යන්ත්‍රෝපකරණවල වටිනාකම ඇතුළත් නොකර රු. 1,765,000 කින් අඩුවෙන් දක්වා තිබුණි. එම කරුණ ජර්නල් සටහන් මගින් පොත්වල නිවැරදි කර ඇති බව. | තථ්‍ය වටිනාකම් හෙළිදරව් කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ මුල් කාර්තුවේ බිල්කළ වරිපනම් හා බදු වටිනාකම රු. 5,565,511 ක් වුවත්, වරිපනම් හා බදු ආදායම් ලෙස රු.8,978,076 ක් ගිණුම්වල දැක්වීමෙන් 2023 මාර්තු 18 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ ආදායම් අතිරික්තය රු. 3,412,565 කින් වැඩියෙන් දක්වා තිබුණි. | වරිපනම් හා බදුවලට අදාල හිඟහිටි වටිනාකම් මෘදුකාංගයක් මාර්ගයෙන් විශ්ලේෂණය කර ලබාදේ. වර්තමානයේ එම මෘදුකාංගය මගින් ප්‍රත්‍යාගණන පිළිබඳ කාර්යයන් සිදුකෙරෙමින් පවතින බැවින් 2023 මාර්තු 29 දිනට පැවැති හිඟහිටි පිළබඳව නිවැරදි දත්ත ලබා ගැනීමට නොහැකිව පවතී. මෙම හිඟමුදල් පිළිබඳ ගැලපීම් 2023 දෙසැම්බර් 31 කාලපරිච්ඡේදයට අදාල මූල්‍ය ප්‍රකාශනවල සිදුකර හෙළිදරව් කරනු ලබන බව. | තථ්‍ය ආදායම හෙළිදරව් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 145(2) වගන්තිය | සභාවට අයත් කඩකාමර 397 ක කුලී ගාස්තු සහ ඉඩම් 95ක් සඳහා ඉඩම් බදු ගාස්තු සංශෝදනය කිරීමට පියවර ගෙන නොතිබුණි. | සභාවට අයත් කඩකාමර 336කින් කඩකාමර 255ක් සඳහා 2024 කාලපරිච්ඡේදයේ තක්සේරු කිරීම් කර කුලී අයකර තිබුණි. ඉඩම් සඳහා තක්සේරු වටිනාකම් නොලැබීම මත නැවතත්, 2025 සැප්තැම්බර් 12 දිනැති ලිපිය නැවත යොමුකර ඇති බව. | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | නගර සභා ආඥා පනතේ (iii) | නගර සභාවට අයත් මාර්ග 50ක් ගැසට් පත්‍රයේ | මාර්ග 50 මාර්ග ලේඛනයට ඇතුළත් කිරීමට ඉදිරි | පනතේ විධිවිධානවලට |

| | | | | |
|---|---|---|---|---|
| | කොටසේ 46 හා 49 වගන්ති | ප්‍රකාශයට පත්කර නොතිබුණි. | කටයුතු සිදුකරමින් පවතී. ඒවා ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරනු ලබන බව. | අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | නගර සභා රීති (111) පරිච්ඡේදයේ 34 වගන්තිය | සභාව විසින් වරිපනම් බදු තක්සේරුවට අදාළව තක්සේරු ලේඛනයක් පවත්වා නොතිබුණි. | සභාවෙහි දේපල ලේඛනය 2009 වර්ෂයේදී තක්සේරු කළ වටිනාකම ඇතුළත් කර පවත්වාගෙන යනු ලැබේ. වර්තමානයේ වරිපනම් හා බදු ලේඛනය යාවත්කාලීන කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින බව. | රීතින්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 110 | වටිනාකම රු. 204,500 ක පාඩු සම්බන්ධයෙන් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | වාහන නඩත්තු යටතේ වූ වියදමක් ලෙස එම විෂයය ලේඛනගත කළ බැවින්, මෙම වියදම පාඩු ලෙස නොසැලකූ බවත් පාඩු ලේඛනයේ ලේඛනගත නොකළ බව. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 මාර්තු 18 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,044,911 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත කාලපරිච්ඡේදයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු සකස් කිරිමට පියවර ගෙන නොතිබුණි.

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂයකට පෙර සිට පවතින ලැබිය යුතු වරිපනම් බදු හා කුලී ශේෂය එකතුව රු. 30,670,200 ක් වූ අතර, හිඟ මුදල් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබූ අතර හිඟ මුදල් සඳහා කාල විශ්ලේෂණයක්ද සිදු කර නොතිබුණි. | මේ වන විට රු. 8,244,935 ක හිඟ මුදල් අයකර ගෙන ඇත. ඉතිරිව පවතින හිඟ මුදල් අයකර ගැනීම සඳහා රතු නිවේදන නිකුත් කිරීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී. 2026 වර්ෂයේ හිඟ මුදල් අයකර ගැනීම සඳහා විශේෂ ජංගම සේවා දියත් කෙරෙන බව. | හිඟහිටි ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සභාව සතු දේපළවලින් ලැබිය යුතු හිඟහිටි බදු ආදායම රු. 733,217 ක් පසුගිය වර්ෂ 05කට අධික කාලයක සිට අයකර ගැනීමට සුදුසු පියවර ගෙන නොතිබුණි. | හිඟමුදල් රු. 733,217 ක් අයකර ගැනීමට සමථ මණ්ඩල කටයුතු සිදුකෙරෙමින් සිටින බව. | -එම- |
| (iii) | සභාව සතු මහජන උද්‍යානය සහ ආපනශාලාව බදු මුදල් සඳහා රු. 548,876 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | 2023 වර්ෂය සඳහා මහජන උද්‍යානයේ හිඟහිටි බදුකරු විසින් නොගෙවීම සම්බන්ධයෙන්, බදුකරුට විරුද්ධව පොලිස් ස්ථානයේ පැමිණිලි කර ඇති බව. | හිඟහිටි බදු කඩිනමින් අයකර ගත යුතුය. |
| (iv) | සභාව සතු කඩ කාමර 304 ක් සහ ඉඩම් 95 ක් සඳහා වූ ඉඩම් බදු ගිවිසුම් කාලය අවසන් වී වර්ෂ 01 සිට 33 දක්වා කාලයක් ඉකුත්වී තිබූ නමුත්, පළාත් පාලන කොමසාරිස්වරයාගේ අංක 1980/46 දරන චක්‍රලේඛයේ 7 ඡේදයට අනුකූලව නැවත ගිවිසුමක් සඳහා එළැඹීමට කටයුතු කර නොතිබුණි. | කඩ කාමර 336 ක් සහ ඉඩම් 95ක් ඇතුළු සම්පූර්ණ කුලී හිමියන් 431 දෙනෙකු සඳහා ගිවිසුම් දිනයන් එකම දිනයකට වෙනස් කිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | නව ගිවිසුම්වලට එළඹ සංශෝධිත බදු අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභාවට අයත් පර්චස් 7 ක ඉඩමක් පුද්ගලයෙකු අත්තනෝමතික ලෙස අත්පත් කරගෙන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යනු ලබන නමුත්, නගර සභා ආඥා පනතේ 255 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාළ ඉඩම, ඉඩම් මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය ලේකම්වරයා මාර්ගයෙන් මායිම් සලකුණු කිරීම අවසන් වූ පසු, අදාළ ඉඩම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | පනතේ විධිවිධානවලට අනුව පියවර ගත යුතුය. |
| (ආ) | නගර සභාව අතිරික්ත අරමුදල් ප්‍රාදේශීය සංවර්ධනය සඳහා භාවිතා කිරීමට පියවර නොගෙන රාජ්‍ය බැංකුවක ජංගම ගිණුමේ පවත්වාගෙන ගොස් තිබූ ශේෂය 2023 මාර්තු 31 දිනට රු.44,425,345 ක් විය. | එම ජංගම ගිණුමේ ශේෂය රු. 65,155,447 කින් 2023 දී නිම කරන ලද වැඩවලින් ඉතිරි වැඩ සඳහා ගෙවිය යුතු ණයහිමි ශේෂය රු. 25,991,245 කි.<br>ජංගම ගිණුමේ අතිරික්තව ඇති අරමුදල් 2024 මාර්තු මාසයේ සිට Swiping Facility බැංකු සේවාව මගින් බැංකුවේ ආයෝජනය කර 2024 වර්ෂය සඳහා ආදායම් ලෙස රු. 1,296,808 ක් උපයා ඇති බව. | අතිරික්ත අරමුදල් ප්‍රදේශයේ සංවර්ධනය සඳහා භාවිතා කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වවුනියාව නිවාඩු නිකේතනයේ හිඟ කුලී රු.2,229,222 ක් 2019 අගෝස්තු මාසයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා හිඟහිටිව පැවතුනි. | 2022 දෙසැම්බර් 31 දිනට නිවාඩු නිකේතනය සඳහා (Rest House) හිඟ කුලී රු. 2,229,222 ක මේ දක්වා නොගෙවීම සම්බන්ධයෙන් නඩුවක් (නඩු අංකය (L218,2022) විභාග වෙමින් පවතී. මෙම නඩුව අවසන් වීමෙන් පසු ලැබෙන තීන්දුව මත පදනම්ව, මෙම හිඟ මුදල් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව. | හිඟ මුදල් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා වවුනියාව නගර සභාව විසින් වවුනියාව කුලම් සංචාරක මධ්‍යස්ථානය සඳහා එකතුව රු. 7,230,939 ක් වැය කර තිබූ නමුත් මෙම වාර්තාවේ දින වන විටත් එය භාවිතයට ගැනීමට පියවර ගෙන නොතිබුණි. | දිසා අධිකරණයේ බදුකරුට එරෙහිව, වර්තමානයේ නඩුවක් විභාග වෙමින් පවතී. තීන්දුව ලැබුණු පසු, තීන්දුව මත පදනම්ව එම සංචාරක මධ්‍යස්ථානය භාවිතය සඳහා ලබාදීම සම්බන්ධයෙන් තීරණයක් ගනු ලබන බව. | සභාව සතු දේපළ උපයෝජනයට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2021-2022 කාල පරිච්ඡේදය තුළ සන්නිවේදන කුළුණු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටු රැස්වීමේදී අනාවරණය කර තිබූ සංශෝධන සිදු කර නැවත ඉදිරිපත් කළ යුතු බවට තීරණය කර තිබුණද, ඊට පටහැනිව සභාපතිවරයා විසින් ගොඩනැගිලි බලපත්‍ර ලබා දී තිබුණි. | සභාවේ සභාපතිවරයා ලෙස කටයුතු කළ ඊ. ගෞතමන් මහතාගේ සාධාරණීකරණය කිරීම සහිතව ඔහුගේ උපදෙස් මත ගොඩනැගිලි බලපත්‍ර ලබා දෙන ලද බව. | කමිටුවේ එකඟතාවය මත බලපත්‍ර ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | නගර සභාව සතු ඉඩම් 28 ක් සඳහා ඉඩම් හිමිකම් ඔප්පු ලබා ගැනීමට නගර සභාව මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සභාව සතු හෙක්ටයාර 16.17 ක වපසරියකින් යුතු භූමි ප්‍රමාණය පවරා ගැනීමේ නියෝග ලබා ගැනීමේ ක්‍රියාමාර්ග නගර සභාව තවදුරටත් සිදු කරමින් සිටී. | දේපළවල අයිතිය තහවුරු කරගත යුතුය. |
| (ඉ) | වවුනියාව නගර සභාව විසින් 2017 වර්ෂයේදී තිරුනාවත්කුලම් අභ්‍යන්තර මාර්ග ගල් අතුරා තාර දැමීමේ කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුට කොටස් මුදලක් වශයෙන් ගෙවිය යුතු රු. 1,136,507 ක් ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබූ අතර, ප්‍රතිපාදන සැලසු | කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත් කාලය තුළ වැඩ නිම කිරීමට අපොහොසත් වීම සහ සම්පූර්ණ කරන ලද වැඩ කොටස සඳහා ගෙවීම් කිරීම තාක්ෂණික නිලධාරී ප්‍රතික්ෂේප කළ අතර එම නිසා 2018 ජනවාරි 24 දින | නියමිත කාලය තුළ කොන්ත්‍රාත් වැඩ අවසන් කර ගෙවීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | කාර්යය නිම කර මහජනතාවට භාවිතය සඳහා ලබා දීමට සභාව පියවර ගෙන නොතිබුණි. | නගර සභාව විසින් කොන්ත්‍රාත්තුව අවසන් කරන ලදී. මෙය පිළිනොගත් කොන්ත්‍රාත්කරු නඩුවක් ගොනු කර ඇත. නඩුවේ තීන්දුව ලැබීමෙන් පසු, අදාල ස්ථාවර තැන්පතුව අවසන් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇති බව. |

**4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| 2023 මාර්තු 18 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් ඇස්තමේන්තු කිරීම් සකස් කර නොතිබුණි. මේ හේතුවෙන්, අදාල කාල පරිච්ඡේදය සඳහා තථ්‍ය ආදායම් සහ වියදම් පිළිබඳ ආදායම් සහ වියදම් විචලනයන් සැසඳීමට හැකියාවක් නොතිබුණි. | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ උපදෙස් ලැබීමෙන් පසුව, වවුනියාව නගර සභාව, වවුනියාව මහා නගර සභාව ලෙසට ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගතයුතු බැවින් එම නිවේදන ලැබෙන තුරු වවුනියාව නගර සභාවේ ලේකම්වරයා ලෙස ක්‍රියාකරන ලෙසට නගර සභාවේ ලේකම්වරයාට පවරා තිබුණු බව. | අයවැය සකස් කර ඒ අනුව සභාවේ කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. |